# සංක්ෂිප්තය

යටත් විජිත යුගයට පෙර හා පසුව අධ්‍යාපන ක්ෂේත්‍රය තුළ විෂයමාලා ප්‍රතිසංස්කරණය විවිධ කාලවකවානුවන්හි සිදු විය. ප්‍රාථමික අධ්‍යාපනයට 1997 දී අධ්‍යාපන ප්‍රතිසංස්කරණ මඟින් හඳුන්වා දුන් අත්‍යවශ්‍ය ඉගෙනුම් නිපුණතා සංශෝධනයන්ට භාජනය වෙමින් 2016 සිට නව සංශෝධන සහිතව පළමු ප්‍රධාන අවධිය සඳහා අත්‍යවශ්‍ය ඉගෙනුම් නිපුණතා 48ක් ක්‍රියාත්මක වේ. මේ අනුව පළමු ප්‍රධාන අවධියට අදාළ අත්‍යවශ්‍ය ඉගෙනුම් නිපුණතා සංවර්ධනයේ දී ගුරුවරුන්ට මතුවන ගැටලු පිළිබඳව විමර්ශනය කිරීම මෙම පර්යේෂණයේ ප්‍රධාන පරමාර්ථය විය. ප්‍රාථමික අධ්‍යාපනය තුළ සිසුන්ගේ සාධන මට්ටම්වල හා ප්‍රවීණතා මට්ටම්වල ඌනා තත්ත්වයක් පවතින බැවින් යම් යම් ගැටලුකාරී තත්ත්වයන් පැනනැඟී ඇති බව ගැටලුව හැඳින්වීමේ දී පැහැදිලි කොට දක්වා ඇති අතර ඒ ඒ කාලවකවානුවන් අනුව විෂයමාලා ප්‍රතිසංස්කරණය වූ ආකාරයත් ඒවායෙහි පැවති ගැටලුකාරී තත්ත්වයන් පිළිබඳවත් මෙම අධ්‍යයනයේ කාලෝචිතභාවය හා වැදගත්කම පිළිබඳවත් තොරතුරු දක්වා ඇත. න්‍යායාත්මක සාහිත්‍ය විමර්ශනය යටතේ පළමු ප්‍රධාන අවධියට අදාළ අත්‍යවශ්‍ය ඉගෙනුම් නිපුණතා සංවර්ධනයේ දී ගුරුවරුන්ට මතුවන ගැටලු පිළිබඳව විස්තර කෙරෙන හා අධ්‍යාපනය හා සම්බන්ධ සිද්ධාන්ත ඉදිරිපත් කර ඇති අතර ආනුභාවික විමර්ශනය යටතේ පළමු ප්‍රධාන අවධියට අදාළ අත්‍යවශ්‍ය ඉගෙනුම් නිපුණතා සංවර්ධනයේ දී ගුරුවරුන්ට මතුවන ගැටලුවලට අදාළව කරුණු ගොනු කර ඇත. මෙම අධ්‍යයනයේ සුවිශේෂී අරමුණු වන්නේ සිසුන් ළඟා කරගෙන ඇති අත්‍යවශ්‍ය ඉගෙනුම් නිපුණතා මට්ටම් පිළිබඳව සොයා බැලීම, අත්‍යවශ්‍ය ඉගෙනුම් නිපුණතා සංවර්ධනය කිරීම සඳහා ගුරුවරුන් විසින් අනුගමනය කරන ක්‍රියාමාර්ග සොයා බැලීම, අත්‍යවශ්‍ය නිපුණතා සංවර්ධනයේ දී ගුරුවරුන් මුහුණ දෙන ගැටලුවල ස්වභාවය පිළිබඳව සොයා බැලීම හා අත්‍යවශ්‍ය ඉගෙනුම් නිපුණතා සංවර්ධනයට අදාළ යෝජනා ඉදිරිපත් කිරීම යි. මීගමුව අධ්‍යාපන කලාපය ඇසුරෙන් සිදුකරන ලද මෙම පර්යේෂණ සඳහා සමීක්ෂණ පිරිසැලසුම යොදාගෙන ඇති අතර නියැදිය ලෙස ප්‍රාථමික පන්ති සහිත පාසල් 29ක්, ගුරුවරුන් 66ක්, විදුහල්පතිවරුන් 14ක් හා ගුරු උපදේශකවරුන් 3ක් යොදා ගැණිනි. සරල අහඹු නියැදීම අනුව පාසල් නියැදියත් සාරම්මන නියැදි පිරිසැලසුම අනුව පාසල්වල දෙවන ශ්‍රේණියේ සමාන්තර පන්තිවල ඉගැන්වීම් ක්‍රියාවලියේ යෙදෙන සියලුම ගුරුවරුන් හා විදුහල්පතිවරුන්ගේ නියැදියත් මීගමුව අධ්‍යාපන කලාපයේ ප්‍රාථමික ගුරු උපදේශකවරු තිදෙනාත් වශයෙන් නියැදිය තෝරා ගන්නා ලදී. මෙහි දත්ත රැස් කිරීමේ උපකරණ ලෙස ලේඛනගත තොරතුරු, ඇගයීම් පත්‍රිකා, ප්‍රශ්නාවලි, නිරීක්ෂණ හා සම්මුඛ සාකච්ඡා යොදා ගන්නා ලදී. සිසුන් ළඟා කරගෙන ඇති අත්‍යවශ්‍ය ඉගෙනුම් නිපුණතා මට්ටම් පිළිබඳව සොයා බැලීමේ දී අනාවරණය වූයේ 75% ක සිසුන් පිරිසක් ප්‍රවීණත්වයට පත්ව ඇති බවත් ආසන්න ප්‍රවීණත්වයට පත්ව ඇති ශිෂ්‍ය සංඛ්‍යාව 17% ක් බවත් ප්‍රවීණත්වයට දුරස් සිසුන් 8% ද සිටින බවත් ය. බහුතර ශිෂ්‍ය පිරිසක් ප්‍රවීණතාවයට දුරස් බව අනාවරණය වූයේ ''දෙමළ බසින් අසන සරල ප්‍රශ්නවලට දෙමළ බසින් පිළිතුරු දෙයි'' යන නිපුණතාව සඳහා ය. අත්‍යවශ්‍ය ඉගෙනුම් නිපුණතා සංවර්ධනයේ දී ගුරුවරුන් අනුගමනය කරන ප්‍රධාන ක්‍රියාමාර්ග ලෙස කණ්ඩායම් ක්‍රියාකාරකම්, කලුලෑල්ල භාවිතය, කණ්ඩායම් ලෙස පන්තිය සකස් කිරීම, ක්‍රියාකාරකම පැහැදිලි කොට සිසුන්ට කිරීමට යොමු කිරීම, පසුගාමී අයට උදව් ලබා දීම, ප්‍රශ්න ලබා දීමෙන් අවබෝධය තහවුරු කිරීම යනාදිය බව අනාවරණය විය. අත්‍යවශ්‍ය ඉගෙනුම් නිපුණතා සංවර්ධනයේ දී ගුරුවරුන් මුහුණ දෙන ගැටලුවල ස්වභාවයන් ලෙස අත්‍යවශ්‍ය ඉගෙනුම් නිපුණතා සංවර්ධනය පිළිබඳව දෙමව්පියන්ගේ සොයා බැලීම දුර්වල මට්ටමක පැවතීම, නිපුණතා සියල්ල පාසල් කාලය තුළ නිමකළ නොහැකි වීම, අභ්‍යන්තර අධීක්ෂණයට පැමිණි අයගෙන් ලද සහය ප්‍රමාණාත්මක නොවීම, නිපුණතා මට්ටමට ළඟා නොවූ සිසුන් සඳහා පාඩම අතරතුර දී අමතර කාලයක් යෙදවීමට සිදුවීම, සිසුන් විසින් ගෙදර වැඩ කරගෙන ඒම දුර්වල මට්ටමක පැවතීම ආදිය අනාවරණය විය.

ගුරුවරුන් මුහුණ දෙන ගැටලු සඳහා විසඳුම් ලෙස නිපුණතා සංවර්ධනය නොවූ සිසුන් එම පන්තියේම නැවත අවුරුද්දක් රඳවා ගැනීම, සිසුන්ගේ දෙමව්පියන් කැඳවා නිතර නිතර දරුවන්ගේ අඩුපාඩු පිළිබඳව දැනුවත් කිරීම, ප්‍රවීණතා මට්ටමට ළඟා නොවූ සිසුන් සංවර්ධනය සඳහා දැනුම තවදුරටත් ලබා දීම ආදිය ඉදිරිපත් විය. පළමු ප්‍රධාන අවධියට අදාළ අත්‍යවශ්‍ය ඉගෙනුම් නිපුණතා සංවර්ධනයේ දී ගුරුවරුන්ට මතුවන ගැටලු පිළිබඳව සිදු කරන ලද අධ්‍යයනයෙන් නිගමනය කළ හැක්කේ පළමු ප්‍රධාන අවධිය සඳහා ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියේ නිරත ගුරුවරු අත්දැකීම් බහුල දීර්ඝ සේවා කාලයක් බහුල ගුරුවරුන් බවත් පවුල් පරිසරය හා දෙමව්පියන්ගේ ක්‍රියාකලාපය තුළ සිසුන් විසින් ප්‍රවීණතාවට දුරස් වීම හා ප්‍රවීණත්වයට ආසන්න වීමට හේතු වී ඇති බවත් පළමු ප්‍රධාන අවධියට අදාළ සිසුන්ගේ අත්‍යවශ්‍ය ඉගෙනුම් නිපුණතා තවදුරටත් සංවර්ධනය විය යුතු බවත් අත්‍යවශ්‍ය ඉගෙනුම් නිපුණතා සංවර්ධනය කිරීමේ දී ගුරුවරුන් විසින් මුහුණ දෙන ප්‍රධානතම ගැටලුවක් ලෙස සිසුන්ගේ පවුල් පසුබිම හා සාමාජීය පරිසරය සම්බන්ධ ගැටලුව හඳුන ගත හැකි බවත් ය.

# Abstract

Curricular reforms occurred in the Education sector on various periods of times prior to and after the Colonial era. The Essential Learning Competencies introduced by the educational reforms of year 1997, has been subjected to many amendments and from 2016, 48 essential learning competencies with amendments are operative for the key stage one in primary education. Accordingly, this study inquires in to the issues that arise in developing essential learning competencies related to the key stage one in primary education. The introduction about the issue clearly presents the manner how challenging situations have risen due to the low levels of proficiency and achievements of students in primary education, further information on how curriculums have been amended during different time periods and the challenging situations therein as well as the timely nature and importance of this study is described in the description of the background of this issue. Under theoretical literary review, issues that arise in developing essential learning competencies related to key stage one in primary education are described while presenting theories on education and for empirical review, facts have been presented under the study "Issues that arise in developing essential learning competencies related to key stage one" related to local and foreign resources. The specific objectives of this study are, inquiring in to the levels of essential learning competencies achieved by students, the steps adopted by teachers in developing essential learning competencies, the issues faced by teachers in developing essential learning competencies and proposing solutions for the issues faced by teachers. The method of investigation has been used for this research conducted in relation to the Negombo Educational Zone and 29 schools with Primary Grades, 66 Teachers, 14 Principals and 3 Teaching Instructors have been used as the sample. The Sample of Schools was selected in accordance with the method of Simple Random Sampling, all the Teachers engaged in the teaching process of all the parallel Grade Two classes of the Schools were selected in accordance with the method of Stratified Sampling, the Sample of principles was selected as per the interests of the Principles and the three primary teaching instructors in charge of the Divisions of Negombo Educational Zone were selected as the sample. Documented information, Evaluation sheets, Questionnaires, inspections and Interviews were used as tools of data collection in this study. During the study on the essential learning competencies acquired by children, it was revealed that 75% of the children under review had acquired the necessary proficiency while 17% had reached near proficiency and 8% of the students were far from proficiency. Most Number of students showed that they were far from proficiency for the skill of "Answers simple questions asked in Tamil language using Tamil language". It was revealed that, group activities, using the black board, preparing the classroom as groups, explaining the relevant activity and directing the students to follow, helping the backward students and confirming that the students comprehended by providing questions, were the main activities followed by teachers in developing Essential Learning Competencies. During the research on the issues faced by teachers in Developing Essential Learning Competencies, it was also revealed that issues such as, the follow up of parents on Developing Essential Learning Competencies being very poor, the inability to complete all the skills during school time, the support received from the persons related to internal inspection being insufficient, teachers having to allocate extra time amidst lessons for students who have not reached the necessary levels of competencies, the students not completing the homework assigned to them, lead to this. Retaining the students who have not developed the necessary skills in the same class, summoning the parents of students often and making them aware of particular weaknesses of their children and providing knowledge for the development of students who have not reached the necessary levels of skills were produced as proposals to solve the issues faced by teachers. Through this Study on the Issues faced in developing Essential Learning Competencies related to the Key Stage One, it can be concluded that the teachers engaged in the teaching learning process are well

experienced teachers with many years in service, the family environment and the behaviors of parents has led to the students reaching or not reaching proficiency and that the Essential Learning Competencies of the students in the Key Stage One have to be further developed and finally that the issue of the family background and social environment of the students can be recognized as the major issue faced by teachers in developing Essential Learning Competencies of students.